# සති පාසල කාර්ය පත්‍රිකාව

**01.** පන්තිය : 13 ශ්‍රේණිය විෂයය : සංයුක්ත ගණිතය අදාළ සතිය : අගෝස්තු 1 සතිය

**02.** නිපුණතාව : **2-** ඒකතල බල පද්ධති භාවිත කරයි.

නිපුණතා මට්ටම : 2.12 ඒකාකාර සමමිතික වස්තුවල සක්න්ධ කේන්ද්‍රය නිර්ණය කිරීමට විවිධ ක්‍රම ශිල්ප යොදා ගනියි.

**03.** මෙම සතිය තුල නියමිත පාඩම්වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵල :

1. තලයක වූ අංශු පද්ධතියක ස්කන්ධ කේන්ද්‍රය අර්ථ දක්වයි.
2. ආස්තරයක ස්කන්ධ කේන්ද්‍රය අර්ථ දක්වයි.
3. රේඛාවක් වටා සමමිතික ඒකාකාර වස්තුවල ස්කන්ධ කේන්ද්‍රය සොයයි.
4. තලයක් වටා සමමිතික වස්තුවල සක්න්ධ කේන්ද්‍රය සොයයි.
5. විවිධ හැඩ ඇති ආස්තරවල ස්කන්ධ කේන්ද්‍රය සොයයි.
6. තුනී ඍජුකෝණාස්‍රාකාර පටි භාවිතයෙන් ඒකාකාර ත්‍රිකෝණාකාර ආස්තරයක ස්කන්ධ කේන්ද්‍රය සොයයි.
7. තුනී ඍජුකෝණාස්‍රාකාර පටි භාවිතයෙන් සමාන්තරාස්‍රයක හැඩය ඇති ඒකාකාර ආස්තරයක ස්කන්ධ කේන්ද්‍රය සොයයි.

**04.** ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් කෙටියෙන්

- “ස්කන්ධ කේන්ද්‍රය” පාඩමෙහි “ඉගෙනුම් ක්‍රියාවලියට අත්වැලක්” යන කාර්ය පත්‍රිකාවේ 1 - 2 පිටුවල 2.12 කොටස හොඳින් කියවා ඔබ අධ්‍යයනය කළ යුතු විෂයය තොටස් හඳුනා ගන්න.
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සංයුක්ත ගණිතය - ස්ථිතිකය II පොතෙහි 59-80 පිටු අධ්‍යයනය කරන්න.
- e තක්සලාව, e නැණ පියස, ගුරු ගෙදර, youtube නාලිකා, පාසල් ශිෂ්‍ය සමූහ (Whatsapp, Viber, …) Google class room, online ඉගෙනුම්, පාසල් වෙබ් අඩවි, හෝ මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක මඟින් පාඩමට අදාළ ඉගැන්වීම් / පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.

**05.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්, Website, LMS පාඩම්, වෙනත් ආධාරක (Online, Offline, Printed)

- e - තක්සලාව LMS
  - i. https://www.e-thaksalawa.moe.gov.lk/web/si/
  - ii https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=787
- e නැණපියස -
  https://www.enenapiyasa.lk/lms/course/index.php?categoryid=23
- වෙනත් - යූ ටියුබ්
  - I. https://www.mathsapi.com/2017/09/combined-maths-notes.html
  - II. https://www.dpeducation.lk/si/grade/13

iii. https://youtu.be/FIAHryOkqcA

iv. https://youtu.be/BiORqsz8fWk

v. https://youtu.be/CFBXwktmZFg

- අතිරේක පොත්පත්

I. අ.පො.ස උසස් පෙළ ගණිතය හදාරන ආරම්භකයින් සඳහා වූ පදනම් පාඨමාලාව - ජාතික අධ්‍යාපන ආයතනය

II. සංයුක්ත ගණිතය පුහුණු වීමේ ප්‍රශ්නාවලිය (පිළිතුරු සමග) - ජාතික අධ්‍යාපන ආයතනය

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සංයුක්ත ගණිතය - ස්ථිතිකය II

**06.** ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -

1.අරය r වන උස h වන කුහර සිලින්ඩරයක ස්කන්ධ කේන්ද්‍රය සොයන්න .

2. අරය a හා උස h වන ඝන සිලින්ඩරයක ස්කන්ධ කේන්ද්‍රය සොයන්න.

3.අරය r වන කුහර අර්ධ ගෝලයක ස්කන්ධ කේන්ද්‍රය සොයන්න.

4.ඒකාකාර ත්‍රිකෝණාකාර ආස්තරයක ස්කන්ධ කේන්ද්‍රය සොයන්න.

5.සමාන්තරාස්‍රාකාර ආස්තරයක ස්කන්ධ කේන්ද්‍රය සොයන්න .